පසුගිය දිනක සිදුවූ එකම සිදුවීමක් දිවයින සහ මව්බිම පුවත්පත් ඔස්සේ වාර්තා කර තිබුණු ආකාරය අපට නිරීක්ෂණය කිරීමට හැකි විණි. මෙහිදී මව්බිම සිරස්තලයෙන් දැක්වුණේ "පෙම්වතුන් දුන් බීර බී සා.පෙළ සිසුවියෝ පිස්සු නටලා" යනුවෙන් වන අතර, එම පෙම්වතුන් අත්අඩංගුවට ගැනීමට පොලිසියට නියෝග කළ බවද උපසිරස්තලයක දැක්වේ. කෙසේ වෙතත් දිවයින සිරස්තලයේ සඳහන් වන්නේ "සිංහල ඉගෙන ගන්න ගමන් බියර්වලින් පදම් වූ සිසුවියෝ දැලේ" යනුවෙන් වන අතර, එම පුවත් අන්තර්ගතය තුළ සිසුවියන් පානීය ජල බෝතල් උපයෝගී කරගනිමින් සිංහල පංතිය වෙත බියර් රැගෙන විත් ඇති බවත්, සිසුවියන් දීර්ඝ කාලයක සිට මත්පැන් වලට හුරු වී ඇති බවත්, සිසුවියන් සඳහා මත්පැන් ගෙනැවිත් දී ඇත්තේ කළු පැහැ කාරයකින් පැමිණෙන පුද්ගලයෙකු බවත් මූලික පරීක්ෂණ වලින් හෙළිවී ඇතැයි දැක්වේ.

මෙහිදී එකම පුවතක් පුවත්පත් දෙක ඔස්සේ වාර්තා කෙරී ඇති ආකාරය වෙනස් බව අපට නිරීක්ෂණය කළ හැක. මව්බිම පුවතේ සිසුවියන් වෙත පමණක් වරද පැටවීමක් සිදු නොකොට, එම සිදුවීමේ පසුතලයද ඉදිරිපත් කොට ඇති බව දැකිය හැක. කෙසේ වෙතත් දිවයින පුවත එම සිදුවීමේ එක් පාර්ශවයක් පමණක් පෙන්වමින්, එම සිසුවියන් වෙත පමණක් සිදුවීමේ වරද පටවා ඇති බවද දැකිය හැක. එසේ බලන කළ, දිවයින පුවත අසම්පූර්ණ වාර්තාකරණයක් පමණක් නොව, කාන්තාවන් කොන්කිරීමකට ලක් කිරීමක්ද නොවන්නේද?

**#MediaEthicsSL #lka #SinhalaPress #Divaina #Mawbima**
See Less